සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2019

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- අංක 01 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පරිගණකයේ තාවකාලික මතක ඒකකය වන්නේ,

(1) ROM (2) RAM (3) Hard Disk (4) DVD

02 පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකය CPU පිහිටා ඇති පරිගණක ප්‍රධාන උපාංගය වන්නේ,

(1) සංදර්ශකය (2) යතුරු පුවරුව
(3) පද්ධති ඒකකය System Unit (4) දෘඪ තැටිය

03 මධ්‍යම සැකසුම් ඒකකයේ සියලුම අංක ගණිතමය හා තාර්කික කටයුතු සිදුකරන උපාංගය වන්නේ,

(1) Alu (2) CU (3) UPS (4) Memory register

04 ජංගම දුරකථනවල දැකිය හැකි මෙහෙයුම් පද්ධතියක් වන්නේ,

(1) Android (2) XP (3) linux (4) Java

05 පරිගණක යතුරු පුවරුවේ ඇති කාර්ය යතුරු ගණන,

(1) 5 (2) 4 (3) 12 (4) 25

06 යතුරු පුවරුවේ ඇති යතුරු අතරින් කිසිම සංකේතයක් දැකිය නොහැකි යතුර වන්නේ

(1) Alt (2) Ctrl (3) Delete (4) Space

07 දෙවන පරිගණක පරම්පරාවේ භාවිතා කළ ප්‍රධාන විද්‍යුත් තාක්ෂණික උපක්‍රමය වන්නේ,

(1) රික්තක නලය (2) ට්‍රාන්සිස්ටරය (3) IC (4) කෘත්‍රිම බුද්ධිය

08 පරිගණකයේ සැකසුමේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ

(1) Kilo byte (2) bits (3) GB (4) GHZ

09 ද්වීමය සංඛ්‍යා පද්ධතියේ ඇති සංඛ්‍යාංක වන්නේ,

(1) 0 (2) 0.1 (3) 1.2 (4) 0, 1, 2

10 පරිගණක තිරයක් බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් පරිගණකයට සම්බන්ධ කරන කෙවෙනිය වන්නේ,

(1) PS2 කෙවෙනිය (2) USB
(3) සමාන්තර කෙවෙනිය (4) වීඩියෝ (VGA) කෙවෙනිය

11 පරිගණක විද්‍යාගාරයකදී පරිගණකවලට අඛණ්ඩව විදුලිය සැපයීම සිදුකරන උපක්‍රමය වන්නේ,

(1) UPS (2) CPU
(3) බිත්ති කෙවෙනිය (4) Power Suply Unit

12 යෙදවුම් මෘදුකාංගයක් වන්නේ,

(1) වෙබ් ලිපිනය (2) මෙහෙයුම් පද්ධතිය
(3) වෙබ් අතරික්සුව (4) linux

13 පරිගණකයේ තිරය තුළ දිනය හා වේලාව දක්වෙන්නේ,

(1) PC Icon තුළය. (2) කෙටිමං සලකුණ මතය.
(3) මාතෘකා තීරුව තුළය. (4) කාර්ය තීරුව තුළ

14 චිත්‍රක හෝ ග්‍රැෆික් ලිපිනයට අදාල ගොනු දිගුවක් විය හැක්කේ,

(1) .doc (2) .MP4 (3) MP3 (4) .png

15 ඇල්ගොරිතමයක් ලිඛිතව ඉදිරිපත් කරන ක්‍රමය වන්නේ,

(1) ව්‍යාජකේත ය. (2) ද්වීමය කේත ය. (3) ගැලීම් සටහන් (4) රූප සටහන් ය.

16 ඇල්ගොරිතම පාලනව ව්‍යුහයන් නොවන්නේ,

(1) අනුක්‍රමික (2) පුණර්කරණය (3) තේරීම (4) ප්‍රතිවිගාපනය

17 ප්‍රකාශ මාධ්‍ය දත්ත ආචයන උපාංගයක් වන්නේ,

(1) CD (2) දෘඪ තැටි (3) සැනෙලි මතක (4) චුම්බක පටි

18 පරිගණකයේ දත්ත ගබඩාකරණය / ආචනය වන මූලික තැනුම් ඒකකය වන්නේ,

(1) GB - ගිගා බයිට් වේ. (2) MB - මෙගා බයිට් වේ.

(3) bit - බිටුව වේ. (4) Kb - කිලෝ බිටුව වේ.

19 ප්‍රථම පරම්පරාවේ නිර්මිත පරිගණක වර්ගයක් වන්නේ,

(1) Intel (2) Mac (3) IBM (4) ENIAC

20 පරිගණකයේ ඇති ලිපිගොනු ආරක්ෂිත ක්‍රමඋපායන් වන්නේ,

(1) මකාදැමීම (2) ස්ථාන කීපයක සුරක්ෂිත කිරීම

(3) මුරපද භාවිතය (4) හැංගීම හා මැකීම

- අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට දක්වෙන ප්‍රකාශය (✓) හෝ (✗) බව දක්වන්න.

21 සංඛ්‍යා පද්ධතියක උපරිම සංඛ්‍යාංකය එහි පාද අගයට සමාන වේ. (.......)

22 ROM මතකය යනු තාවකාලික මතකයකි. (.......)

23 MS - Word යනු යෙදවුම් මෘදුකාංගයකි. (.......)

24 අන්තර්ජාලයට ප්‍රවේශ වීමට වෙබ් අතරික්සුවක් (browser) අත්‍යවශ්‍ය වේ. (.......)

25 තුන්වන පරම්පරාවේ පරිගණක සඳහා අනුකලිත පරිපථ (IC) භාවිතා විනි. (.......)

- පහත දක්වෙන නිරූපණවල කාර්යයන් ලියන්න හෝ නම් කරන්න.

26  ......................................................................

27  ......................................................................

28  ......................................................................

29  ......................................................................

30  ......................................................................

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01 (i) පරිගණකයට රූප හා වීඩියෝ ඇතුලත් කරන උපාංග තුනක් ලියන්න.

(ii) USB කෙවෙනිය හරහා සම්බන්ධ කල හැකි උපාංග තුනක් නම් කරන්න.

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

| පරිගණක පරම්පරාව | ලක්ෂණ |
|---|---|
| ..............A.............. | අධික තාපය හා රික්තකනල |
| දෙවන පරම්පරාව | ..............B.............. |
| තෙවන පරම්පරාව | ..............C.............. |
| ..............D.............. | කෘතිම බුද්ධිය |

(iv) පරිගණක විද්‍යාවේ පියා කවුරුන් ද?

02 (i) පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යා පද්ධතිය | පාද අගය | අවයව සංඛ්‍යාව | අ. අගය | අවසන් |
|---|---|---|---|---|
| ද්වීමය | a.................. | b.................. | 0 | c.................. |
| දශමය | d.................. | e.................. | 0 | e.................. |
| g .................. | 8 | h.................. | 0 | i .................. |
| j | 16 | k.................. | 0 | l .................. |

(ii) පහත දක්වෙන දශමය සංඛ්‍යා ද්වීමය කරන්න.

135 71 15

03 (i) නම සහහ උපන්දිනය ඇතුලත් කර 2019. 04. 01 දිනට වයස ගණනය කිරීමට අදාල ව්‍යාපකේතය හා ගැලීම් සටහන අඳින්න.


04 (i) පහත දක්වෙන එක් එක් කාර්යයන් කරගැනීමට භාවිතා කල හැකි වදන් සංස්කරණ මෙවලම තෝරා ලියන්න.

(1) සියලුම අකුරු Capital අකුරු බවට පත් කිරීම.

(2) ලිපිනය මාතෘකාව මැදට එකෙල්ලය කිරීම.

(3) තෝරාගත් වචනයක වර්ණය වෙනස් කිරීම.

(4) ඡේදයක අක්ෂර වින්‍යාසය පරීක්ෂාව.



A B C D E F G H I

(ii) My Document තුළ grade 9 ලෙස folder සදන ආකාරය පියවර වශයෙන් ලියන්න.

05 පහත දක්වෙන පරිගණක පිරිවිතර විස්තර පත්‍රිකාවට අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| සකසනය | Intel® Core I5 3.70 GHZ |
| මතක ධාරිතාවය | 8 GB |
| දෘඪතැටිය | 1 TB |
| තිරය | 18.5" LCD |
| මෙහෙයුම් පද්ධතිය | LINUX |
| මිල | Rs. 95000 |
| වගකීම් කාලය | 4 years |
| වර්ණය | black |

(i) පරිගණකයක් මිලදී ගැන්මේදී සලකා බලන තාක්ෂණික පිරිවිතර 3 ලියන්න.

(ii) පරිගණකයක් මිලදී ගැනීමේදී සලකා බලන තාක්ෂණික නොවන පිරිවිතර 3 ලියන්න.

(iii) සකසනයේ වේගය හා ප්‍රධාන මතක ධාරිතාවය කොපමණ ද?

(iv) සකසනයේ වර්ගය ලියන්න.

(v) මෙහි සඳහන්කර ඇති සංදර්ශකයට අමතර දැකිය හැකි සංදර්ශක වර්ගයක් ලියන්න.